සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | භූගෝල විද්‍යාව | 2 | 2. ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය |

සැකසුම : ඩබ්ලිව්. අයි.එස්. කුමාරි

බප/හො/පැල්පොල කනිෂ්ඨ විද්‍යාලය

## ශ්‍රී ලංකාවේ අනන්‍යතාව යනු කුමක්ද?


**‘ශ්‍රී ලංකාව සෙසු රටවලින් වෙන්කර හඳුනා ගැනීමට ඇති හැකියාව’**

ශ්‍රී ලංකාවේ අනන්‍යතාව ආකාර දෙකකින් හඳුනාගත හැක.

1. භූගෝලීය අනන්‍යතාව
2. සමාජීය අනන්‍යතාව


# භූගෝලීය අනන්‍යතාව

භූගෝලීය අනන්‍යතාව අපට ආකාර කිහිපයකින් දැක්විය හැක.




2.1 රූපය – ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාව

# ශ්‍රී ලංකාවේ පිහිටීම



- කර්කටක නිවර්තනය හා මකර නිවර්තනය අතර සමකයට ආසන්නව ශ්‍රී ලංකාව පිහිටා ඇත.

# රටක පිහිටීම ආකාර දෙකකින් දැක්විය හැක

## 1. සාපේක්ෂ පිහිටීම

ආසන්න වටපිටාවේ ඇති ගොඩබිම් සාගර යනාදිය පදනම් කරගෙන රටක පිහිටීම දැක්වීම

## 2. නිරපේක්ෂ පිහිටීම

අක්ෂාංශ දේශාංශ අනුව රටක පිහිටීම දැක්වීම

# ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම




- උතුරින් ආසියා මහාද්වීපය
- දකුණින් ඉන්දියන් සාගරය
- නැගෙනහිරින් අග්නිදිග ආසියාතික රටවල්
- බටහිරින් අප්‍රිකා මහාද්වීපය


# ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම

උතුරු අක්ෂාංශ

$5^0\ 55^1 - 9^0 51^1$

නැගෙනහිර දේශාංශ

$79^0\ 41^1 - 81^0 53^1$



# ශ්‍රී ලංකාවේ විශාලත්වය

ශ්‍රී ලංකාවේ මුළු භූමි වර්ග ප්‍රමාණය

ව. කි. 65610



# ශ්‍රී ලංකාවේ මුහුදු සීමා කලාප

**රාෂ්ට්‍රීය මුහුදු සීමාව -** නාවික සැතපුම් 12

**යාබද මුහුද -** නාවික සැතපුම් 24


**අනන්‍ය ආර්ථික කලාපය-** නාවික සැතපුම් 200



# ශ්‍රී ලංකාවේ භූ විෂමතාවය

ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටමේ සිට භූමියේ උස අනුව ප්‍රධාන භූවිෂමතා කලාප තුනකි

- වෙරළබඩ තැනිතලාව (උස මීටර් 30 ට අඩු)
- අභ්‍යන්තර තැනිතලාව ( උස මීටර් 30 සිට 300 දක්වා)
- මධ්‍යම කඳුකරය (උස මීටර් 300 වැඩි)




2.1 F සිතියම - ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප

# වෙරළබඩ තැනිතලාවේ භූ විෂමතා ලක්ෂණ



පුළුල් තැනිතලා



බොකු



කලපු



දූපත්



තුඩු

# මධ්‍යම කඳුකරයේ භූ විෂමතා ලක්ෂණ




කඳුවැටි




සානු



කපොලු



නිම්න



දියඇලි


# අභ්‍යන්තර තැනිතලාවේ භූ විෂමතා ලක්ෂණ



ශේෂ කඳු



තැනිතලා



හෙල් වැටි

# ශ්‍රී ලංකාවේ දේශගුණය

- උෂ්ණත්වය




වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 27-30 අතර

- වර්ෂාපතනය



- මෝසම් වර්ෂාව
- සංවහන වර්ෂාව
- වාසුලි වර්ෂාව




# ශ්‍රී ලංකාවේ වර්ෂාපතන රටා

# ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය හා වර්ෂාපතන රටාවන්ට අනුකූලව වනාන්තරවල ස්වභාවය විවිධාකාර ය



තෙත් කලාපයේ උසින් වැඩි ශාක



කඳුකර ප්‍රදේශවල උසින් අඩු ශාක





පතන හා තෘණ තලා




කඩොලාන



ශුෂ්ක කටු පඳුරු



සමාජයීය
අනන්‍යතාව

# සමාජීය අනන්‍යතාව

## සමාජීය අනන්‍යතාව යනු කුමක්ද?

යම් රටක ජීවත් වන ජන වර්ග කාලයක් තිස්සේ ප්‍රගුණ කරගෙන ඇති සම්ප්‍රදායන්, සිරිත් විරිත් ,ඇදහිලි, විශ්වාස, වටිනාකම්, සාරධර්ම, භාෂාව ආදී සම්මතයන් සියල්ල තුළින් එම රට පිළිබඳව හඳුනා ගැනීම.

# ලක්වැසියෝ







ශ්‍රී ලංකාව බහු වාර්ගික හා බහු ආගමික සංස්කෘතියක් ඇති රටකි



# සංස්කෘතිකාංග සහ උත්සව



වෙසක් උත්සවය



පොසොන් උත්සවය



මඩු මංගල්‍ය උත්සවය



දීපවාලි උත්සවය



රාමසාන් උත්සවය



සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය




මහනුවර දළදා පෙරහර

නත්තල් උත්සවය



# අපේ ජාතික උරුම



ජාතික උරුම
ස්පෘශ්‍ය උරුම
අස්පෘශ්‍ය උරුම
මානව නිර්මිත
ස්වාභාවික නිර්මිත
ආගමික මධ්‍යස්ථාන
වෙනත් නිර්මාණ
භෞතික ව දැකිය නොහැකි මානව හැසිරීම තුළින් අනාවරණය වන දෑ
• ශ්‍රී මහා බෝධිය
• මඩු දේවස්ථානය
• කතරගම පූජා භූමිය
• මුස්ලිම් දේවස්ථාන
• නල්ලූර් කෝවිල
• සීගිරිය
• රන්මසු උයන
• යාපන කොටුව
• වැව් හා වාරිමාර්ග
• සිංහරාජ වනාන්තරය
• නාමල් උයන
• හික්කඩුව වෙරළ
• උණු දිය ළිං
• දියඇලි
• ආගන්තුක සත්කාර
• වැඩිහිටියන්ට සැලකීම
• ගරු සැලකිලි
• සිරිත් විරිත්

ශ්‍රී මහා බෝධිය



මඩු දේවස්ථානය



කතරගම පූජා භූමිය



# ආගමික මධ්‍යස්ථාන



මුස්ලිම් දේවස්ථානය



නල්ලූර් කෝවිල



දළදා මාළිගාව

# ආගමික නොවන වෙනත් නිර්මාණ



සීගිරිය




රන්මසුඋයන



යාපනය කොටුව





වැව් හා වාරිමාර්ග

# ස්වභාවික නිර්මිත



නාමල් උයන



හික්කඩුව වෙරළ



සිංහරාජ වනාන්තරය



උනු දිය ලිං



දියඇලි


On the Cushion of Hospitality, Guest is a Jewel.


Respect Starts With You


©Food Corner





# අස්පෘශ්‍ය උරුම









ආගමික මධ්‍යස්ථාන සහ ආගමික නොවන වෙනත් නිර්මාණ සියල්ල *මානව නිර්මිත* (මිනිසා විසින් ගොඩනගන ලද) වන අතර මේවා *ස්පෘශ්‍ය උරුම* (අතින් ඇල්ලිය හැකි) වේ

මිනිසා විසින් ගොඩනගා නොමැති සියල්ල *ස්වාභාවික නිර්මිත* වන අතර භෞතිකව දැකිය නොහැකි මානව හැසිරීම් තුළින් විද්‍යමාන වන සිරිත් විරිත්, ගරු සැලකිලි, ආගන්තුක සත්කාර වැනි දෑ *අස්පෘශ්‍ය උරුම* ලෙස හැඳින්වේ.

# ආදිවාසී ජනතාව









- ශ්‍රී ලංකාවේ අතීතයේ සිට පැවත එන ආදිවාසී ජනතාව නොහොත් වනාන්තරයේ ජනතාව, අදටත් ලංකාවේ **මහියංගණය , දඹාන, හෙන්නානිගල** වැනි ප්‍රදේශවල ඔවුන්ටම ආවේණික භාෂාව, සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, සංස්කෘතිකාංග රැක ගනිමින් බෝග වගාව, දඩයම් කිරීම, වන ද්‍රව්‍ය රැස් කිරීම ජීවනෝපාය කොටගෙන ජීවත් වෙති

# ශ්‍රී ලංකාවේ ජාතික උරුම පිහිටි ස්ථාන



# ශ්‍රී ලංකාවේ පවතින ලෝක උරුම

*මේවා ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ අනන්‍යතාව ප්‍රකට කිරීමට සමත් වී ඇත*



මහනුවර පූජා නගරය



සීගිරිය



දඹුලු විහාරය


*මානව නිර්මිත*



පොලොන්නරුව



ගාලුකොටුව




අනුරාධපුරය

# ස්වාභාවික නිර්මිත



සිංහරාජ
ලෝක උරුම වන භූමිය
SINHARAJA
WORLD HERITAGE SITE
FOREST DEPARTMENT
6 Km




# සමාජ සංවර්ධනය

ශ්‍රී ලංකාව දකුණු ආසියාවට අයත් රටකි. ඉන්දියාව, බංග්ලාදේශය, නේපාලය, භූතානය, පාකිස්ථානය, මාලදිවයින දකුණු ආසියාවේ සෙසු රටවල් ය.



# ආසියාතික රටවල සමාජ සංවර්ධන දත්ත

| රට / සමාජ සංවර්ධන දත්ත | ඉන්දියාව | පකිස්ථාන | බංගලාදේශ | නේපාලය | ශ්‍රී ලංකාව | භූතානය | මාලදිවයින |
|---|---|---|---|---|---|---|---|
| ආයු අපේක්ෂාව (2020) | 69.7 | 67.3 | 72.7 | 70.9 | 77.1 | 71.9 | 79.04 |
| සාක්ෂරතාව % අවු: 15 සහ ඉහල (2020) | 77.7 | 58 | 74.7 | 67.9 | 91.7 | 66.6 | 97.7 |
| උපත් අනුපාතිකය 1000 (2020) | 17.6 | 27.5 | 17.7 | 19.4 | 15.3 | 16.8 | 13.5 |
| ළදරු මරණ අනුපාතිකය සජීවී උපත් 1000ට (2020) | 29.8 | 59.1 | 24.7 | 26.1 | 7.1 | 22.3 | 6.2 |
| මාතෘ මරණ අනුපාතිකය 1000 (2020) | 130 | 186 | 173 | 239 | 36 (2017) | | 53 |

(අන්තර්ජාලය ඔස්සේ ලබාගත් තොරතුරුවලින් සැකසිණි 2020)

සවියෙන් පෙරට - අපි එකට
e-ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | භූගෝල විද්‍යාව | 2 | 2. ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය - ඇගයීම |

**සැකසුම : ඩබ්ලිව්. අයි.එස්. කුමාරි**
**බප/හො/පැල්පොල කනිෂ්ඨ විද්‍යාලය**

**I කොටස - භූගෝලීය අනන්‍යතාවය**

1. ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය යනු කුමක්ද?

2. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ කුමන නිවර්තන රේඛා අතරද?

3. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පිහිටි සමුද්‍ර සන්ධිය කුමක්ද?

4. යම්කිසි රටක පිහිටීම දැක්විය හැකි ආකාර දෙකකි. ඒ මොනවාද?

5. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම හා ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම වෙන වෙනම ලියන්න

6. ශ්‍රී ලංකාව අවට ඇති දූපත් තුනක් නම් කරන්න.

7. ලංකාවට අයත් මුහුදු සීමා කලාප තුනකි. ඒවා මොනවාද?

8. ශ්‍රී ලංකාවට අයත් රාශ්ට්‍රීය මුහුදු සීමාව කොපමණදැයි නාවික සැතපුම් වලින් දක්වන්න

9. ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප බෙදීමේ නිර්ණායකය කුමක්ද?

10. ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප සම්බන්ධ පහත වගුව පුරවන්න

| <u>භූවිෂමතා කලාපය</u> | | | |
|---|---|---|---|
| <u>සීමාව (මීටර්වලින්)</u> | | | |
| <u>භූ විෂමතා ලක්ෂණ</u> | <u>1.</u> | <u>1.</u> | <u>1.</u> |
| | <u>2.</u> | <u>2.</u> | <u>2.</u> |
| | <u>3.</u> | <u>3.</u> | <u>3.</u> |
| | <u>4.</u> | | <u>4.</u> |

11. ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය කීයද?

12. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම ඇසුරෙන් පහත වගුව පුරවන්න.

| | | | |
|---|---|---|---|
| **වර්ෂාපතන රටාව** | | | |
| **වර්ෂාපතනය ලැබෙන මාස** | | | |
| **වර්ෂාපතනය හටගැනීමට හේතු** | | | |
| **වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශ** | | | |

13. ශ්‍රී ලංකාවට වියළි කාලගුණයක් පවතින්නේ කිනම් මාස වල ද?

**II කොටස - සමාජීය අනන්‍යතාව**

1. ජාතියට අනන්‍ය ආගම යාකරන්න

| | |
|---|---|
| සිංහල | හින්දු |
| දෙමළ | ක්‍රිස්තියානි |
| මුස්ලිම් | බෞද්ධ |
| බර්ගර් | ඉස්ලාම් |

2. ශ්‍රී ලංකාවේ ජීවත් වන විවිධ ජාතින්ගේ සංස්කෘතික උත්සව දෙක බැගින් වෙන වෙනම ලියන්න

3. ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව ජීවත් වන ප්‍රදේශ තුනක් නම් කරන්න


4. ජාතික උරුම බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කොට ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

5. ශ්‍රී ලාංකිකයන් සතු ස්පෘශ්‍ය උරුම අතරින් මානව නිර්මිත හා ස්වාභාවික නිර්මිත පහ බැගින් වගුවක දක්වන්න

6.ශ්‍රී ලංකාවට අයත් ජාත්‍යන්තර පිළිගැනීමට ලක් වූ ලෝක උරුම පහක් නම් කරන්න

**III කොටස - සමාජ සංවර්ධනය**

1. දකුණු ආසියා කලාපයට අයත් රටවල් ලකුණු කර නම් කරන්න



2. ආසියාතික රටවල සමාජ සංවර්ධන දත්ත වලට අනුව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පහත තොරතුරු දක්වන්න.

| | |
|---|---|
| ආයු අපේක්ෂාව | …………….. |
| සාක්ෂරතාව | …………….. |
| උපත් අනුපාතිකය | ……………. |
| ළදරු මරණ අනුපාතිකය | …………….. |
| මාතෘ මරණ අනුපාතිකය | …………….. |

3. දකුණු ආසියාතික සෙසු රටවල් හා සසඳන කල ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමක පැවැතීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු කාරණා තුනක් නම් කරන්න

සවියෙන් පෙරට - අපි එකට

**e**-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | භූගෝල විද්‍යාව | 2 | 2. ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය - පිළිතුරු |

**සැකසුම : ඩබ්ලිව්. අයි.එස්. කුමාරි**

**බප/හො/පැල්පොල කනිෂ්ඨ විද්‍යාලය**

**I කොටස - භූගෝලීය අනන්‍යතාවය**

1. ශ්‍රී ලංකාව සෙසු රටවලින් වෙන්කර හඳුනා ගැනීමට ඇති හැකියාව
2. කර්කටක නිවර්තනය හා මකර නිවර්තනය අතර
3. පෝක් සමුද්‍ර සන්ධිය
4. සාපේක්ෂ පිහිටීම, නිරපේක්ෂ පිහිටීම
5. **<u>සාපේක්ෂ පිහිටීම</u>**

   උතුරින් ආසියා මහාද්වීපය

   දකුණින් ඉන්දියන් සාගරය

   නැගෙනහිරින් අග්නිදිග ආසියාතික රටවල්

   බටහිරින් අප්‍රිකා මහාද්වීපය

   **<u>නිරපේක්ෂ පිහිටීම</u>**

   උතුරු අක්ෂාංශ $5^0\ 55^1 - 9^0 51^1$

   නැගෙනහිර දේශාංශ $79^0\ 41^1 - 81^0 53^1$

6. මාලදිවයින, නිකොබාර් දූපත්, අන්දමන් දූපත්
7. රාෂ්ට්‍රීය මුහුදු සීමාව, යාබද මුහුද, අනන්‍ය ආර්ථික කලාපය
8. නාවික සැතපුම් 12
9. මුහුදු මට්ටමේ සිට භූමියේ උස

10.

| භූවිෂමතා කලාපය | වෙරළබඩ තැනිතලාව | අභ්‍යන්තර තැනිතලාව | මධ්‍යම කඳුකරය |
|---|---|---|---|
| **සීමාව (මීටර්වලින්)** | උස මීටර් 30 ට අඩු | උස මීටර් 30 සිට 300 දක්වා | උස මීටර් 300 වැඩි |
| **භූවිෂමතා ලක්ෂණ** | 1 කලපු | ශේෂ කඳු | කඳුවැටි |
| | 2 දූපත් | හෙල් වැටි | සානු |
| | 3 පුළුල් තැනිතලා | තැනිතලා | නිම්න |
| | 4 බොකු | | දියඇලි |

11. සෙල්සියස් අංශක 27-30 අතර

12.

| වර්ෂාපතන රටාව | නිරිත දිග මෝසම් වර්ෂාව | ඊසානදිග මෝසම | සංවහන වර්ෂාව | වාසුළි |
|---|---|---|---|---|
| **වර්ෂාපතනය ලැබෙන මාස** | මැයි, ජුනි, ජුලි | නොවැම්බර් දෙසැම්බර් ජනවාරි | මාර්තු අප්‍රේල් සැප්තැම්බර් ඔක්තෝබර් | ඔක්තෝබර් නොවැම්බර් දෙසැම්බර් |
| **වර්ෂාපතනය හටගැනීමට හේතු** | නිරිත දෙසින් රට තුළට ඇතුළු වන ජල වාෂ්ප සහිත සුළං ධාරා හේතුවෙන් | ඊසාන දෙසින් රට තුළට ඇතුළු වන ජල වාෂ්ප සහිත සුළං ධාරා හේතුවෙන් | අධික සූර්ය තාපය හේතුවෙන් | බෙංගාලබොක්ක ප්‍රදේශයේ හට ගන්නා වායු කැළඹීම් හේතුවෙන් |
| **වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශ** | බටහිර සහ නිරිත දිග ප්‍රදේශවලට | උතුරු නැගෙනහිර සහ ඊසාන දිග ප්‍රදේශවලට | සියලුම ප්‍රදේශ වලට ලැබිය හැක | උතුරු නැගෙනර ප්‍රදේශවලට |

13. පෙබරවාරි, අගෝස්තු

**II කොටස - සමාජීය අනන්‍යතාව**

1. සිංහල - බෞද්ධ

   දෙමළ -හින්දු

   මුස්ලිම්- ඉස්ලාම්

   බර්ගර් - ක්‍රිස්තියානි

2. බෞද්ධ - සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය/ වෙසක් උත්සවය

   හින්දු - දීපවාලි උත්සවය/ මඩු මංගල්‍ය උත්සවය

   ඉස්ලාම්- ඊද් උත්සවය /හජ්ජි උත්සවය

   ක්‍රිස්තියානි- නත්තල් උත්සවය/ පාස්කු උත්සවය

3. මහියංගනය, හෙන්නානිගල, දඹාන

4. ස්පෘශ්‍ය උරුම - අතින් ඇල්ලිය හැකි මානව නිර්මිත / ස්වාභාවික නිර්මිත
   අස්පෘශ්‍ය උරුම - භෞතිකව දැකිය නොහැකි මානව හැසිරීම් තුළින් විද්‍යාමාන වන සිරිත් විරිත්, ගරු සැලකිලි, ආගන්තුක සත්කාර වැනි දෑ

5. මානව නිර්මිත - ශ්‍රී මහා බෝධිය, සීගිරිය, යාපනය කොටුව, නල්ලූර් කෝවිල, මඩු දේවස්ථානය
   ස්වාභාවික නිර්මිත - සිංහරාජ වනාන්තරය, නාමල් උයන ,උණු දිය ළිං, දියඇලි

6. මහනුවර පූජා නගරය, සිංහරාජ වනාන්තරය, අනුරාධපුර පූජා නගරය, දඹුලු විහාරය, ගාලුකොටුව ,සීගිරිය

**III කොටස - සමාජ සංවර්ධනය**

1. 

| | | |
|---|---|---|
| 2. | ආයු අපේක්ෂාව | 77.1 |
| | සාක්ෂරතාව | 91.7 |
| | උපත් අනුපාතිකය | 15.3 |
| | ළදරු මරණ අනුපාතිකය | 7.1 |
| | මාතෘ මරණ අනුපාතිකය | 36 |

3.

